රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 21/2023

මගේ අංකය : EST-1/CIRL/03/0001
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2023.10.19

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ රැස්වීම් පැවැත්වීම</u>**

විවිධ රාජ්‍ය ආයතන විසින් මාර්ගගත ක්‍රමවේද ඔස්සේ සංවිධානය කරනු ලබන විවිධ රැස්වීම් සහ සාකච්ඡා සඳහා, දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් සතියේ වැඩ කරනු ලබන දිනවල රාජකාරි වේලාව තුළ දී, නිතර නිතර සහභාගි කරවා ගැනීම හේතුවෙන් එම නිලධරයන් මුණගැසීමට පැමිණෙන මහජනතාවට ඔවුන්ගේ ගැටලු සාකච්ඡා කිරීමට තිබෙන අවස්ථාව ප්‍රමාණවත් නොවන බැවින් නොයෙකුත් දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදු වන බවට තොරතුරු වාර්තා වී ඇත.

02. ඒ අනුව ඉදිරියේ දී දිස්ත්‍රික් ලේකම්වරුන් සහ/හෝ ප්‍රාදේශීය ලේකම්වරුන් සම්බන්ධ කරගනිමින් මාර්ගගත ක්‍රමවේද ඔස්සේ රැස්වීම් පැවැත්වීමේ දී සතියේ අඟහරුවාදා සහ සිකුරාදා යන දින දෙක පමණක් යොදා ගැනීමට කටයුතු කළ යුතු වේ.

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112662340
ෆැක්ස් : 0112692158
විද්‍යුත් ලිපිනය : ade-i@pubad.gov.lk